# සිංහලයන්ගේ මුල් දියුණුව මෙපමණ ශීඝ්‍රයෙන් ඇතිවූයේ කෙසේද?*

ආචාර්ය නන්දදේව විජේසේකර

ක්‍රි.ව. පූර්ව 6 වන ශතවර්ෂයෙහිදී පමණ විජය කුමරු හා පිරිස ලක්දිවට පැමිණියායින් පසු ශතවර්ෂයක් ගෙවී යන්නටත් පෙර පණ්ඩුකාභය රජු සමයෙහි අනුරාධපුරය දියුණු නගරයක ස්වභාවය ඉසුළු බව මහාවංශයෙන් පෙනේ. එතන සිට ශතවර්ෂ දෙකකට පසු දේවානම් පියතිස්ස රජු සමයේ දී මේ තත්ත්වය තවදුරටත් දියුණුවට පත්වූ බවට මහාවංශය දෙස් දෙයි. මෙපමණ ශීඝ්‍රයෙන් පුරාණ සිංහලයන් දියුණු වීමට හේතු කවරේදැයි සෙවිය යුතු නොවේ ද? මේ දියුණුව කෙසේ වූයේ දැයි දැන ගැනීම වැදගත් නොවේ ද?

අති විශිෂ්ට ශිෂ්ටාචාරයක් බිහිවුණු පුරාතන රටවලින් මෙතෙක් සොයාගෙන තිබෙන සාක්ෂි පරිදි එක් නිගමනයකට පැමිණෙන්ට පුළුවනි. එය නම් පැරණි ශිෂ්ටාචාරයක පසුබිම ක්‍රම ක්‍රමයෙන් දියුණුව කරා යාමෙන් ශිෂ්ටාචාරයක් හැදෙන වැඩෙන බවයි. ඒ හැරත් ජාතියක සංවර්ධනයට විවිධ මනුෂ්‍ය වර්ගයා අතර නානා ප්‍රකාර හේතූන් ඇතත්, මූලික වශයෙන් ඒ හා සමාන දියුණුවක මුල් පදනම කෘෂිකර්මය මුල් කරගෙන ඇති වෙන්නකි. තවද පැරණි ශිෂ්ටාචාර ගැන සලකා බලන කල ඒවායින් වැඩි ප්‍රමාණයක් ගංගා නිම්න භූමීන්හි ඇතිවූ බවට සාක්ෂි බොහෝය.

මිසරය, මැසපොටේමියාව, ඉන්දියාව හා චීනය යන රටවල අතීතයේ විශිෂ්ට ශිෂ්ටාචාර ඇතිවී පැතිර ගොස් නැතිවී ගිය බව කවුරුත් පාහේ හොඳින් දන්නා කරුණකි. පුරා විද්‍යාඥයන්ගේ පර්යේෂණ මගිනුත්, මේ කරුණු තහවුරු කොට තිබේ. හැබැයි ශිෂ්ටාචාරයකට අයිති සංස්කෘතික සාධක ස්ථිරවම නොපවතී. කලින් කල වෙනත් සංස්කෘතික හා ආධ්‍යාත්මික බලපෑම්, ආශ්‍රය හා පෝෂණය ලැබීමෙන් එක්කෝ එක් ශිෂ්ටාචාරයක් දියුණු වෙයි නැතිනම් මිශ්‍රවෙයි. එසේත් නැතිනම් නැතිවෙයි. මෙසේ සිදුවන්නේ එකිනෙකාගේ බලමහිමය නියාමය. දියුණුවූ ශිෂ්ටාචාරයක් පැතිරෙයි. පැතිරීයාමෙන් එහි කේන්ද්‍රස්ථානයේම ශිෂ්ටාචාරය පිරිහීමෙන් අතුරුදහන් වෙන්ටත් ඉඩ තිබෙන්ට පුළුවනි.

ශ්‍රී ලංකාද්වීපය ගැන ද සිතා බැලිය යුත්තේ මේ හා සමාන න්‍යායකින්ය. ඉහත සඳහන් කළ රටවල්හි මෙන් ලංකාවේ පැරණි යුගය සම්බන්ධයෙන් සාර්ථක පරීක්ෂණයක් කළ බවක් අපට දැනගන්නට නැත. එසේ කළත් සාර්ථක ප්‍රතිඵලයක් ලැබූ වගක් පළ කොට නොමැත. විජය කුමරු ලක්දිවට පැමිණෙන්ට පෙර සමය ගැන තොරතුරු සෙවීමේ නිරතවූ අයගේ සංඛ්‍යාවද ඉතා ස්වල්පය.

මෙතෙක් බොහෝ සෙයින් පැතිර තිබෙන මතය නම් ක්‍රි.පූ. 6 වන ශතවර්ෂයට අයත් ලක්දිව යක්ෂ, රාක්ෂ, හා නාගයින් විසූ ම්ලේච්ඡ යුගයක් වූ බවයි. රාවණ නැමැති රජෙකු විසූ බව ද, ඇතැම් විට අසන්ට ලැබේ. ජනප්‍රවාදයෙහිත්, පොතපතෙහිත්, මේ ප්‍රවෘත්තිය සඳහන් වී තිබේ. මේ සමය ගැන මෙයාකාරයෙන් සිතන්නට

පෙළඹවී තිබෙන ප්‍රධාන හේතුවක් නම් ලංකාවේ ඉපැරණි වංශ කථා හා පුරාණ කථා බොහොමයක් වාගේ සකස් වී ඇත්තේ ඉම් මූලික පදනම පිටයි.

රාමායණ මහා කාව්‍යයෙහි සුන්දර කාණ්ඩයෙහි දක්වන පරිදි ලංකාව වනාහි රාවණ ප්‍රභුවරයාගේ සකලෛශ්වර්යයෙන් සම්පන්න මුතු මැණික්, රන්, රිදී, වස්තුවලින් පිරිගිය රාජධානියකි. මහාවංශයෙහි සඳහන් පරිදි මේ හා සමාන ධන සම්පත්තිය හා මැණික් ආදියෙන් පරිපූර්ණ වූ නාග රාජධානි කීපයක් රට ඇතුළත හා මුහුදුබඩ අසල පිහිටා තිබුණි. නූතන පොතපත ලියා ඇත්තේත්, විදේශික ආකල්පයකිනි. විදේශික රටාවකට ගැලපෙන සේය. අපේ පැරණි ශිෂ්ටාචාරය අගය කළෙත් බටහිර ශිෂ්ටාචාරයේ අංගෝපාංග මුල් කරගෙනය. අපේ කලා කෘතීන් විවේචනයට ලක් කළේත් බටහිර කලා මූලධර්ම ආශ්‍රය කරගෙනය. එහෙත් ලක්දිව පැරණි ශිෂ්ටාචාරය කෙසේ බිහිවූවාදැයි සෙවීමට සෑහෙන වෑයමක් කිසිවෙක් නොකළෝය. පැරණි ලංකාවේ සිතිය නොහැකි තරම් දියුණුවක් පෙර කල ඇතිවී නැතිවී තිබෙන බව නම් දැන් දැන් සිතන්නට පටන්ගෙන ඇත. එය වනාහි විජය කුමරුගේ ආගමනයෙන් පසු පමණක් ඇතිවූ තත්ත්වයක් ද එසේ නැතිනම් ඊට පෙර සිට පැවත එන දේශීය පදනමක් මුල්කරගෙන ගොඩනැගුවක් දැයි පරීක්ෂාකර බැලීමට දැන් කාලය එළඹ තිබේ. පැරණි පසුබිමක් පිට ගොඩනැගූ ශිෂ්ටාචාරයක් නම් ඊට මූලික හේතු කවරේදැයි නිශ්චය කර ගත නොහැකි තරම්ය. කෙසේ වෙතත් විජය කුමරුගේ ආක්‍රමණයෙන් පසු කලකදී ඇතිවූ ශිෂ්ටාචාරයක් නම් මෙපමණ කෙටි කාලයකදී මෙපමණ උසස් දියුණුවක් කෘෂිකාර්මික සමාජයක් ලැබුවේ කුමන හේතූන් කරණ කොට ගෙන දැයි පරීක්ෂා කිරීම මේ දේශනයෙහි පරමාර්ථයයි.

ලෝකප්‍රසිද්ධ ඉතිහාසඥයකු වන ආර්නෝල්ඩ් ටොයින්බි නමැති මහා පඬිවරයා විසින් ලියූ "ලෝක ඉතිහාසය ඉගෙනීම" නමැති විශාල ග්‍රන්ථයෙහි එක් කොටසක ලංකාව ගැන මෙසේ කියයි: ගංගා නිම්න භූමියක විසූ කුඩා ජනකායකට මෙපමණ කෙටි කාලයකදී මෙතරම් විශිෂ්ට ශිෂ්ටාචාරයක් බිහි කරන්නට හැකිවූයේ කෙසේ දැයි තවමත් විසඳාගත නොහැකි ප්‍රහේලිකාවක් වී තිබේ.

මෙවැනි ප්‍රශ්නයක් මතු කිරීමට හේතු මාත්‍රයක්වත් ඔහුට පෙනෙන්නට නැත. දියුණුව නම් ඇත්තකි. එය සිදුවූ ආකාරය හෝ මාර්ගය කුමක් දැයි දැන ගැනීම අසීරුය. අන්‍ය රටවල මේ හා සමාන දියුණුවක් දක්නට ලැබෙන්නේ ක්‍රම ක්‍රමයෙනි. යුගයෙන් යුගයෙනි. ගංගානිම්න භූමිවල ඉදිකෙරෙන ශිෂ්ටාචාර ඉබේම, ශීඝ්‍රයෙන් බිහිවන්නේ නැත. ස්වාභාවික පිළිවෙත එසේ නම් ලංකාවේ පමණක් ඊට එතරම් වෙනස් ක්‍රමයක් ඇතිවීමට හේතු තිබිය යුතුය. එය නොදැන සිටීම නිසා එය ප්‍රතික්ෂේප කිරීම නුවණට හුරු නොවේ. එසේනම් මෙතෙක් ප්‍රකට නොවූ රහසිගතව තිබෙන තත්ත්වයක් මෙහි තිබෙන්නට ඇති බව අනුමාන කිරීම නුසුදුසු ද? ඒ බවට සාධකයන් පෙන්වා ඔප්පු කිරීම දැනට අපොහොසත් වුවත් එවැනි රහසක් හෙළි කිරීමට ප්‍රයත්නයක් දැරීම ඉතිහාසඥයන්ගේ පරම යුතුකමකි. පුරාවිද්‍යාඥයන්ගේ බැරෑරුම් වගකීමකි.

මේසා මහත් ව්‍යායාමයකදී නුන් වැදැරුම් පර්යේෂණ මාර්ගයක් අනුගමනය කළ-යුතු බව අපේ අවංක විශ්වාසයයි. මෙහිදී පුරෝගාමීව ක්‍රියා කළ යුත්තේ පුරා-විද්‍යාඥයන් හා මානව විද්‍යාඥයන් විසිනි. ප්‍රථමයෙන්ම එක් කරුණක් කිව යුතුයි. එනම් මේ සම්බන්ධයෙන් ආරම්භ කරන හා කරන්නට අදහස් කරන පර්යේෂණ පුරා විද්‍යාත්මක හා මානව විද්‍යාත්මක මූලධර්මයන් මාර්ගයෙන් කළ යුතු බවයි.

අප අතර ජනසම්මත ජන කවි ජන කථා පුරාණෝක්ති වංශ කථා යනාදියෙන් ජනප්‍රවාද බොහෝය. ලක්දිව පුරාණ වාසීන් ගැන මහාවංශයේත්, රාමායණ මහා කාව්‍යයේත්, වෙනත් සාහිත්‍ය පොත පතෙත්, යකුන් නැටීමේදීත්, පෙනෙන්නට හා අසන්නට පුළුවන. මිථ්‍යා කථා, දේව කථා හා යක්ෂ කථා මෙවැනි ගවේෂණයකදී වැදගත් ස්ථානයක් ගනී. මෙහිලා විශේෂයෙන් මතක් කළ යුතුව තිබෙන්නේ කොහොඹ කංකාරියයි. ඒ නැටීමේදී වැදගත් වන්නේ විස්තර කරන කථා මාලාවයි. මෙකී ජනප්‍රවාද අතර පුරාණ වාසීන් ගැන වැදගත් කරුණු රාශියක් විශේෂයෙන්ම මානව වංශය ගැනත්, සමාජය හා සමාජ ක්‍රමය ගැනත්, ආගමික ඇදහිලි අභිචාර ක්‍රම යන මෙකී අංශයන් පිළිබඳ ඡායා මාත්‍රයක් වශයෙන් වත් පැරණි සභ්‍යත්ව හා සංස්කෘතික ලක්ෂණ ගැබ්වී තිබෙන්නට හෝ පෙනෙන්නට හෝ පුලුවන. වලාහස්ස ජාතකයෙහි කියවෙන්නේ ලක්දිව යක්ෂ රාක්ෂ වර්ගයා විසූ බවයි. වයඹ දෙස වෙරළාසන්නයෙහි විසූ ස්ත්‍රීහු තම දරුවන් ඇකයෙහි තබාගෙන අවුත් මිනිසුන් වසඟ කළෝය. මේ මිනිසුන් අතර නාවිකයෝ, වාණිජ ව්‍යාපාරිකයෝ වූහ.

දෙවනුව මෙකී පර්යේෂණයක දී ලක්දිව පැරණිම යුගයට අයිති කලා කෘතීන් ගැනද ඇස් යොමු කිරීම මැනවි. පැරණි වැව් තැනීම, අමුණු බැඳීම, වාරිමාර්ග ක්‍රමය, කළුගල් කැපීම, ගෘහනිර්මාණ ශිල්පය, මූර්ති කලාව, චිත්‍ර කලාව පැරණිම සමාජයන්හි වැදගත් ස්ථානයක් උසුලා සිටිය බව පෙනෙන්නට තිබේ. මේ විෂයයන් සැකවින් සිතා බැලිය යුතුයි. පැරණි සම්ප්‍රදයන් අනුගමනය කරමින් හා පැරණි කලා කෞශල්‍යයෙන් මෙකී කලා කෘතීන් නිර්මාණය කරන්නට ඇත්දැයි විමසීමටවත් කරුණක් විය යුතුයි.

තුන්වෙනුව පුරාවිද්‍යාඥයන් විසින් විද්‍යානුසාරයෙන් පුරාණ වාසීන්ගේ යයි සැක කරන හෝ සැක කළ හැකි වාසභූමි තැනීමෙන් වැදගත්ම සාක්ෂි ලබා ගන්නට හැකි වෙනවා ඒකාන්තයි. ඇතැම් රටවල ප්‍රාග් ඉතිහාසයක් හෝ පැරණි ඉතිහාසයක් සම්පූර්ණ වශයෙන්ම ගොඩනගා ඇත්තේ පොළොව මතුපිට නොව පොළොව යට මෙතෙක් සැඟවී තිබුණු වස්තු ලබාගැනීමෙනි.

පොළොව යට සැඟවී තිබෙන්නට පුළුවන් ඓතිහාසික සාක්ෂි කිසිවෙකුට සිතාගත නොහැකි තරම්ය. එබැවින් එකී දේවල් වල වටිනාකම අගය කිරීම නොකළ හැක. පොළොව කැනීමෙන් හෙළිවෙන කරුණු මාර්ගයෙන් ලැබෙන සාක්ෂි ඉතාමත් ප්‍රවේසමෙන් සලකා බලා පිළිගත මැනවි. තත්ත්වය මෙසේ තිබියදී පුරාණවාසීන්ගේ වාසස්ථාන හැටියට බාහිර ලක්ෂණ වලින් පිළිගත හැකි භූමි භාග තිබේනම් ඒවා හාරා බැලීමට අප්‍රමාදව කටයුතු ආරම්භ කළ යුතුය. මෙතෙක් නොකළ දේ, මග හැරිය දේ, අතපසුවී තිබෙන දේ පුරාවිද්‍යාඥයන් විසින් නොපමාව පිරිමසාලීමෙන් විජය කුමරුන්ට පෙර සමය ගැන නොසිතුවිරු සාක්ෂි ලැබෙන්නට ඉඩ ඇත.

මෙතන සිට මෙකී ශීර්ෂයන් යටතේ එක් එක් විෂයයන් ගැන සලකා බැලීම ඉතිරි කාර්යයි. විජය කුමරුගේ පිරිස කෘෂිකර්මය දැන සිටි බව සිතන්නට ඉඩ තිබේ. ගොවිකමත් සතුන් බෝ කිරීමත් දැන සිටියත් වැව් සාද අමුණු බැඳ වාරිමාර්ග ක්‍රමයකට ඇබ්බැහි වී සිටියේ දැයි සිතා ගැනීමට එපමණ පහසු නොවේ. මක්නිසාද කියතොත් පුරාණ ඉන්දියාවේ එවැනි ජලය යවන ක්‍රමයක් දැන සිටි බවට සාක්ෂි නොමැත. එවැනි තාක්ෂණික ක්‍රමයක් චීනයේත් ලංකාවේත් පමණක් දැන සිටි බවත් එය ක්‍රියාවේ යෙදවූ බවත්, හිතා ගැනීමට සෑහෙන සාක්ෂි ඇත. චීනයෙන් ලංකාවට මෙවැනි ඥානයක්

ලැබුණු බව සිතන්නට ඉඩ නැත. එසේ නම් ඒ වාරිමාර්ග ක්‍රමය ලංකාවට ආවේණිකවූ ශාස්ත්‍ර ඥානයක් බව පිළිගැනීමට සිදුවී තිබේ. ශ්‍රී ලංකාද්වීපයේ නෂ්ටාවශේෂ වශයෙන් දැනටත් දක්නට තිබෙන වාරිමාර්ග ක්‍රමය පැරණි වාසින් ගේ පැරණි වාරිමාර්ග ක්‍රමය අනුගමනය කිරීමක් විය හැක. එහි ගැබ්වී ඇත්තේ පැරණි කාලීන මුතුන්මිත්තන්ගේ දැනීමයි.

ලාංකිකයන්ගේ පුරාණ වාරිමාර්ග ක්‍රමය එදත්, අදත්, දක්ෂ බුද්ධිමත් නූතන ඉංජිනේරුවන්ගේ මවිතයට ලක්වී තිබීම පුදුමයක් නොවේ. පුදුමය නම් මෙවැනි දියුණු ඥානාන්විත ක්‍රමයන් නිපදවන්නට ඥාන ශක්තිය තිබුණත් ඒ සඳහා යොදගත් උපකරණ යන්ත්‍ර සූත්‍ර, මොනවාද යන්නයි. ඒ ප්‍රශ්නය විසඳීමට නම් සමතෙක් නැත. ජෝසප් නීඩ්හම් නමැති විශිෂ්ට විද්‍යාඥයාගේ ස්ථිර අදහස නම් වාරිමාර්ග ක්‍රමය වනාහි යම් කිසි හේතූන් නිසා පුරාණ ලංකාවේත් චීනයේත් නිපදවූ කාර්මික පිළිවෙතක් බවයි. චීනයේ විද්‍යාව හා ශිෂ්ටාචාරය (Science & Civilization in China Vol. IV) නමැති පොතේ ඔහු මෙසේ ලියයි. ''මෙසපොටේමියාව, ටිග්‍රිස්, යුප්‍රටීස්, එසේත් නැතිනම් ඉන්දියාවේ ගංගා නිම්නයන්හි පුරාණ සූක්ෂ්ම වාරිමාර්ග ක්‍රමයක් පෙනෙන්ට නොතිබුණත් ශ්‍රී ලංකාවේ නම් එවැනි ක්‍රමයක් පෙනෙන්ට තිබේ. එය එක් පරම්පරා-වකට පමණක් වෙන්වෙන්ව අයිති කාර්යයක් නොවන බව ද මොනවට පැහැදිලිවන්නේය. ඒ සූක්ෂ්ම ක්‍රමය ක්‍රමානුකූලව දියුණු කළ විද්‍යාත්මක මූලධර්මයන් පදනම් කොට සකස් කරන ලද්දකි.''

කෘෂිකර්මය සමග පවතින ව්‍යාපාරයකි කපු වැවීම. හයවන ශතවර්ෂය වන කල කපු කැටීම පුරුදු කළ බව මහාවංශයෙහි කියවේ. විජයගේ පිරිස පොකුණක් සමීපයෙහි කපු කටිමින් සිටින කුවේණි දුටුවෝය (මහාවංශය පරි: VIII–ගා 11–12). නානාවිධ භාණ්ඩ වර්ග හා සහල් ඈ විසින් ඔවුනට පෙන්වන ලදී (ම.ව. පරි: VII – ගා 24). ගසක් යට අනර්ඝ ඇඳක් සාදවා රාත්‍රි කාලය විජය කුමරුන් සමග එකට ගත කළාය. (ම.ව. පරි. VII – ගා 27), මධ්‍යම රාත්‍රි කාලයේ ගී නැටුම් ශබ්ද ඔවුනට ඇසුණි. (ම.ව. පරි. VIII – ගා 30). ගොවිකම දියුණු සමාජයක විද්‍යමාන අංග හැටියට ඉහත සඳහන් දේ පිළිගැනීම යුක්ති සහගත නොවන්නේ ද? එසේ නම් විජයාගමනයට පෙර පැවති වාරිමාර්ග ක්‍රමයෙහි දියුණුව නිසා ඒ තරම් දියුණුවක් පෙර සමයෙහි ලංකාවේ තිබෙන්නට ඇතැයි අනුමාන කිරීම වැරදිද? ඇතැම් සටහන් මගින් සිතිය හැක්කේ ඉන්දියාවේ හෝ ලංකාවේ වරායවලට ද පර්සියන් ධජය කුඹගතකළ නැව් පැමිණියේ කපු, හාල්, කුළුබඩු, ඇත්දළ, වඳුරන් හා මොනරුන් වෙළඳාම පිණිස මිලදී ගෙනයාම පිණිස ය.

එකී සමාජ තත්ත්වයක් තහවුරු කිරීමට වෙනත් කරුණක් ඉදිරිපත් කළ හැක. ක්‍රි.පූ. 500 පමණ වකවානුවේදී අනුරාධ කුමරු වැවක් තනා ඊට දකුණෙන් මාලිගයක් ඉදිකොට එහි වාසය කළේය. (ම.ව. පරි. IX – ගා II) පණ්ඩුකාභය රජු සමයේ (ක්‍රි.පූ. 437) ස්වාභාවික පොකුණක් ගැඹුරුකොට ජලයෙන් පිරවූයේය. (ම.ව. පරි. X ගා 83) ඉක්බිති අභය වැව තැනුවේ. (ම.ව. පරි. X ගා 89) වැව් තැනීම හා අමුණු බැඳීම මේ වකවානුව වන විට දියුණු අඩියක පිහිටි බව මෙයින් පෙනේ.

කළුගල් කැපීම වාරිමාර්ග කර්මාන්තයේදී බොහෝසෙයින් උපකාර වන කාර්යයකි. පැරණි සිංහලයෝ කළුගල් පරිහරණයේ දී විශේෂ දස්කමක් පෑවෝය. එය කුඩා කර්මාන්තයක් නොව අතිවිශාල කර්මාන්තයක් වන්නට ඇත. පුරාණ වාරිමාර්ග

ක්‍රමයට අයත් වැව් අමුණු කොටුවල දක්නට ලැබෙන විශාල ගල් පුවරු කපා, පලා, නෙලාගත් අයුරු පුදුම එලවන සුළුය. ජන සම්මත විශ්වාසය නම් මෙකී ක්‍රියාවන් විශේෂ වීර පුරුෂයන් (යෝධයින්) නැතහොත් යක්ෂයින් යොදවා කරවා ගන්නට ඇති බවයි. මොවුහු කවරහුදැයි ප්‍රශ්න කොට නැත. මේසා විශාල ගල් කර්මාන්තයක් පුරාණ වාසීන්ගෙන් පැවත එන නිෂ්පාදනයක් ලෙස සිතන්නට නොහැකි ද?

පණ්ඩුකාභය කාලයේ දී කළුගලින් නිමකළ විශාල දේවස්ථාන, මාලිගාදිය වැනි ගොඩනැගිලි කීපයක් මහාවංශයෙහි සඳහන්ව් ඇත. ගෘහනිර්මාණයත් සමග නගර නිර්මාණයත් ආරම්භ කළ බව නිසැකයි. පණ්ඩුකාභය රජ උප නගර හතරක්, අභය වැව (බසවක්කුලම) මහජන සුසාන භූමිය, මරණීය දඬුවම් දෙන ස්ථානය (පෝරකය) බටහිර රාජිනීගේ දේවස්ථානය වෙස්සවණගේ නුග වෘක්ෂය තාල වෘක්ෂය ව්‍යාධ දෙවියන්ගේ වෘක්ෂය යෝනන්ට වෙන් කළ ප්‍රදේශය හා මහායාග ගෘහය (ම.ව. පරි.X ගා 88–90) ඇති කළේය. කොහොඹ කංකාරියේ ගල් කණු 60 ක මන්දිර යක් සඳහන් වී ඇත. පැරණි සිද්ධස්ථාන කීප පලක තිබී සොයාගත් විශාල ගල් පුවරු පුරාණ වාසීන්ගේ පූජාගෘහයන්හි නෂ්ටාවශේෂදැයි සැක කරන්නෝ සිටිති.

පස්වන ශතවර්ෂයට අයත් විය හැකි මෙවැනි ඇතැම් නිර්මාණයන් ගැන සුපරික්ෂාකාරීව සිතන කල එක් කරුණක් සිහිවන්නේ නැද්ද? එකල සිංහලයන් තුළ කළුගල් කැපීමේ විශේෂ කුශලතාවක් හා දක්ෂතාවක් නොතිබුණා නම් මෙවැනි හාස්කම් කළේ කෙසේ ද?. මෙවැනි දක්ෂතාවක් ඈත අතීතයේ සිට පැවත එන බුද්ධියක් මුහුකුරා යාමක් හැටියට සැක කිරීම වත් යුක්තිසහගත නොවන්නේ ද?. අවුරුදු 100 ක පමණ විදේශීය ආශ්‍රයෙන්—එනම් විජය රජුගේ සිට පණ්ඩුකාභය රජුගේ කාලය වන තෙක් බලපෑ අයුරු 100 ඇතුළත පමණක් මේ හා සමාන දියුණුවක් ඇතිවිය හැකි ද?. මීට පෙර සිට පැවත එන බුද්ධියත් පළපුරුද්දත්, ඊට යන්තමින්වත් බලපාන්නට ඇති බව සිතීමට බැරිද?.

ඉහත කී දේවස්ථාන හා පූජා ගෘහ මොන විධියේ රූ සටහන් සහිත ඒවා දැයි කිසි-කෙනකුට සිතිය නොහැකිය. යම් කිසි රූපයක්, පූජනීය වස්තුවක්, තිබුණි නම් එය කළුගලෙන් කළ නිර්මාණයක් වෙන්නට ඇත. මූර්තිකලාව පණ්ඩුකාභයට පෙර සමයේත්, ඊට පසු සමයේත්, දැන සිටි බවත්, ඊට මාධ්‍යය කර ගත්තේ කළුගල බවත්, පිළිගත යුතුයි. බුදු සමය වැළඳගත් පසු පැරණි සිංහල ජනයා මූර්ති කලාව ජනප්‍රිය වන ලෙස දියුණු කළෝය. නමුත් එය සාර්ථක වීමට විවිධ ආශ්‍රයන් තිබුණත්, දේශීය යයි සිතා ගත හැකි ලක්ෂණ සමහරක් ගැබ්වී ඇත්තේ ද යන්න ප්‍රශ්න කිරීම වටී. මෙකී කලා ලක්ෂණ සමකාලීන ඉන්දීය ප්‍රතිමාවන්හි දක්ම දුර්ලභ ය. එනම් සෞම්‍ය ගතිය, අධිෂ්ඨාන ශක්තිය, මඳ සිනාසම්පන්න මුහුණ, ශරීරය විනිවිද නොපෙනෙන ස්වභාවය ලංකා ප්‍රතිමාවල දක්නට ලැබෙන විශේෂ අංග විය හැකිද?. එය එසේ නම් මෙකී අංග පරම්පරාගත ශිල්ප ඥානයක දෘෂ්ටිය විය යුතුයි. එයද දේශීය කලා කෞශල්‍යය නොවන්නේ ද?

නිර්මාණ ශිල්පය දන උගත් පිරිසක් විජය කුමරු සමගම ලක්දිවට පැමිණි බවක් දැනගන්ට නැතත්, ඊට පසු කාලයකදී එවැනි ශිල්පීන් කාණ්ඩයක් පැමිණි බවට මහාවංශය සාක්ෂි දරයි (පරි. VII– ගා 56–57). නව නගර පිහිටුවා පදිංචි වීමට ක්‍රියා කළ බව පෙනේ. තම්බපණ්ණි පටුන අසල විජය කුමරු වාසස්ථානයක් ඉදි කළේය.

උපතිස්ස, උරුවේල, උජ්ජේනි, හා විජිත යන ගම් පිහිටුවන ලදී. දැනීමත්, පළපුරුද්දත් තිබුණු ශිල්පීන් සමූහයක් මෙරට එකල නොසිටියේ නම් මේ හා සමාන බැරෑරුම් කටයුත්තක් මෙපමණ ශීඝ්‍රයෙන් ඉටු කළේ කෙසේ දැයි සිතීම පවා උගහටය.

අවුරුදු 100ක් ගතවීමෙන් ලැබූ දියුණුව නිසා රාෂ්ට්‍ර පාලකයෝ පණ්ඩුකාභය සමයේදී අනුරාධපුර නව නගරය විද්‍යානුකූලවත් ශාස්ත්‍රානුකූලවත් නිර්මාණය කිරීමට පොහොසත් වූහ. ඒ අවස්ථාවේදී ප්‍රසිද්ධ ගොඩනැගිලි මාලිගා දේවස්ථාන කීපයක් ද තැනූ බව මහාවංශය කියයි. නගරය කොටස් වශයෙන් සකස් කොට සංවිධානය කරන ලදී. ආගමික අවශ්‍යතාවන් සපුරාලීමටත්, දෙවි දේවතාවන් වැඳපුද ගැනීම පිණිස පූජනීය ස්ථාන ගොඩනගන ලදී. මෙයාකාරයෙන් දූරදර්ශී ඥානයෙන් සමාජයට ඔබිනා රාජ්‍යයට සැහෙන ප්‍රමාණවත් ගොඩනැගිලි රාශියකින් නගරය හොබවන ලදී. මෙකල සමාජ තත්ත්වය ඉන්දියාවේ හා සමාන කළ හැකි වූවත්, ප්‍රශ්නය නම් මෙපමණ කඩිනමින් පිළියෙල කළේ කෙසේද යන්නයි. එසේ කිරීම හැකි වෙන්ට ඇත්තේ සංවිධානය වූ සමාජයක ආධාර උපකාර මගින් විය හැකිය.

මීන් මතුවට පෙන්වන්නට ඉදිරිපත් කෙරෙන අදහස් අවසාන නිගමනය හැටියටවත් සාධක සහිතව තහවුරු කළ හැකි ඒවා හැටියටවත් හුවා දැක්වීම මේ ලිපියේ පරමාධ්‍යාශය නොවේ. විද්වතුන්ගේත්, විශේෂඥයන්ගේත්, ඉතිහාසඥයන්ගේත් අවධානය යොමු කිරීම මෙහි පරමාධ්‍යාශයයි. එහෙත් ලක්දිව ක්‍රි.පූ. 6 වන ශතවර්ෂයෙහි ලංකාවේ පැරණි සමාජය ගැන ඉඟියක් හෝ ඡායා මාත්‍රයක් මෙහි පෙන්වන කරුණු මාර්ගයෙන් ලැබේ නම් එය සාර්ථක පර්යේෂණයට මග පාදනවා ඇත. එක් කරුණක් වත් ඵලදයක ගවේෂණයකට තුඩුදෙන්නට පුළුවන.

මහාවංශයේත්, සෙසු වංශ කථාවලත් ජන කවි වලත් පුරාණෝක්තිවලත් සඳහන් වන්නේ ලංකාද්වීපය යක්ෂ, රාක්ෂ, නාගයන්ගේ වාස භූමියක් බවයි. යක්ෂයන් හා නාගයන් ගැන බුදු සමයේදීත්, අසන්නට ලැබේ. ලක්දිව නාග ගෝත්‍රිකයන් විසුවේ මුහුදුබඩ කැළණිය, නාගදීපය, වැනි ප්‍රදේශවලය. ඉන්දියාවේ නම් නගරවාසී ආර්යයන් ගෙන් ඈත් ප්‍රදේශවල ඔවුහු විසුවෝලු. නමුත් දියුණු සමාජයකට අයත් වෙනත් සභ්‍යත්වයක හවුල් කරුවෝ ලු. මෙයින් පෙනෙන්නේ මොවුන් අමනුෂ්‍ය වර්ගයක් නොවන බවයි. ඉන්දියාවේ එවකට විසූ යක්ෂ හා නාගයන් ගේ තත්ත්වය එසේ නම් ලක්දිව විසූ යක්ෂ නාග ගෝත්‍රිකයන් ඒ හා සමාන තත්ත්වයක් උසුලන්නට ඇත.

යක්ෂ නමින් හඳුන්වනු ලැබූ මනුෂ්‍ය වර්ගයා ලංකාවේ විසුවේ එකල මහියංගනය සිරිසවත්ථු, ලග්ගල, ලෝග්ගල නම් රාජධානිවලය. හත්දිනක් පැවති මංගලෝත්සවයට පෝලමිත්තා මනාලියත් ඇගේ පියා වන මහා කාල සේනත්, මව් වන ගොන්ඩාත්, පැමිණ සිටියෝය. මෙකී නම් වෙනත් සමාජයකට අයිති ඒවා හැටියට පෙනේ. (ම.ව.පරි. VII ගා 32–34) විජය රජු විසින් නෙරපනු ලැබූ කුවේණි ආපසු පලාගියේත් ඇගේ ඥාතීන් විසූ ලංකාපුර නගරයටයි. කෙසේ වෙතත්, මෙකී අය රටේම විසූ උසස් පෙළේ අය වූහ.

වරක් ප්‍රසිද්ධ ස්ථානයක් යම් තැනක ඇතිවූ කල ඊට පසු කාලයකදී ජනයාගේ ආගම වෙනස් වන පරිදි එය අළුත් ආගමේ මුහුණුවරින් පූජනීය ස්ථානයක් වන්නේය. මේ වනාහි ඈත අතීතයේ සිටම මනුෂ්‍ය ලෝකයේ පැවති සිරිතයි. යක්ෂ ජනයාගේ පුරාණ සිද්ධස්ථානය පිහිටා තිබූ ස්ථානවලම බෞද්ධයෝ ඔවුන්ගේ පූජනීය ස්ථාන ඉදි

කළේය. මේ බව මහාවංශයේ සඳහන් වේ. මහේජ යක්ෂයාට කැපකළ තැන ථූපාරාමය ඉදිකරණ ලදී. කාලවේල යක්ෂයාගේ දෙවොල පිහිටි භූමියෙහිම මහසේන රජ විසින් දගැබක් සාදවන ලදී. රකුසකුගේ වාසභූමියෙහි ඉසුරුමුනිය තනන ලදී. මෙකී සිරිත නිසා සමනලකූටය, කැළණිය, මහියංගනය, අනුරාධපුරය, පසුකලකදී බෞද්ධ පූජනීය ස්ථාන වන්නට ඇත. චිත්තරාජ යක්ෂයා අභයවැවේ පහළ පැත්තෙන්, කාලවේල යක්ෂයා නගරයෙහි නැගෙනහිර දෙසෙහිද, පණ්ඩුකාභය රජු විසින් (ක්‍රි.පූ.-400) පදිංචි කරවන ලදී. ඒ හැරත්, රජු විසින් කළ කාර්යයන් විස්තර කරමින් මහාවංශය මෙසේ දක්වයි. වෙනත් යක්ෂයින්ට පුද පූජා පවත්වා උත්සව දිනයන්හි චිත්තරාජ යක්ෂ නායකයත් සමග සම අසුන් ගෙන ප්‍රීති සැප වින්දේය (ම.ව. පරි. – ගා 87). මෙය වනාහි පැරණි මනුෂ්‍ය සමාජයත් පසුව පැමිණි සමාජයත් අතර කලකට පසු ඇති කරගත් සම්මුතියක ලක්ෂණයක් හැටියට සිතිය හැක.

රාමායණ මහා කාව්‍යයෙහි තිබෙන රාවණ කථාව ගැන යමක් කිය යුතුයි. පුරාණ ලංකාවේ සමෘද්ධ රාජධානියක රජ කළේ රාක්ෂ වර්ගයට අයත් රාවණ රජුය. ඔහු ඓතිහාසික පුද්ගලයෙකු බව සිංහලයන්ගේ ජන සම්මත විශ්වාසයයි. රාම රජුගේ සීතාව පැහැරගෙන අහසින් ලක්දිවට ගෙනා බව සත්‍යයක් හැටියට පිළිගනිති. රාවණගේ බලමහිමය හා විරෝදර සත්ගුණවත් ගති පැවතුම් ගැන කිසිවෙක් සැක නොකරත්. රන් රිදී මුතු මැණික් වලින් සාදන ලද මාහැඟි මාලිගා හා මන්දිර රාමායණ කථාවෙහි මොනවට විස්තර කොට තිබේ. රාම රජු සමඟ කළ සටනින් මරුමුවට පත් රාවණගේ ඇවෑමෙන් ඔහුගේ සොහොයුරු විභීෂණ ලංකා රාජධානිය භාරගත්තේය.

ඉන්දියාවේ වර්තමාන ඉතිහාසඥයෝ ලංකාව ගැන මෙකී කථාව මනඃකල්පිත ප්‍රබන්ධයක් හැටියට සලකති. ඒ කථාවේ සත්‍යයක් නැති බව කියති. ඒ සමගම රාමායණ කථාවෙහි විස්තරවූ අනර්ඝ මාලිගා හා මන්දිර නොතිබුණු වගක් නොකියති. එවැනි සුපරසිද්ධ අනාර්ය රාජධානි මධ්‍ය ප්‍රදේශයෙහි ඇතින් විසූ වාණිජ ව්‍යාපාරිකයන් විසින් දියුණු කළ රාජධානි විය හැකිය. ඔවුන් කියන්නේ අපේ ලංකාව රාමායණයෙහි කියන ලංකාව නොවන බව පමණකි. එවකට ලංකාවේ යක්ෂ පරපුරට අයත් රාවණ රාජ්‍යයක් නොපිහිටි බවක්, මෙකී ශාස්ත්‍රීය පර්යේෂණ වලින් නොපෙනේ. එමනිසා රාවණ කථාවේ හරය ප්‍රතික්ෂේප කළ නොහැක.

එසේනම් රාවණ පරම්පරාව ගැන කොහොඹ කංකාරිය නම් නාට්‍යයෙහි සඳහන් වන කරුණු සලකා බැලීම මැනවි. ''ලංකාවේ රාවණ පරම්පරාව'' නමැති ග්‍රන්ථයක් මෑතදී පළවිය. එහි කර්තෘ පෙන්වන්නේ ලංකාවේ පෙර විසූ අය රාක්ෂ, යක්ෂ, නාග ගෝත්‍රිකයන් බවයි. පුරාණ කඩයිම් පොතකද මෙසේ සඳහන් වේ. ''පළමුවෙන් අසුර වංශයෙහි වර රාජ, ඊට පසු රාක්ෂයෝ නාගයෝ යක්ෂයෝ පැමිණියෝය.'' රට වැස්සන් හා ආක්‍රමණිකයන් අතර විරුද්ධතාවක් හටගත් බව කොහොඹ කංකාරියේ කථාවලින් හෙළිවේ. මෙකී අය නම් අසුර, සුර, යක්, වලියක්, රාක්ෂ, වැදියක්, නාග මෙලෙසියක්, බණ්ඩාර, ආර්ය, වර්ගයෝය. ඔව්හු නැටුමේදී දෙවිවරුන් 12 ක් පුදති. ඔවුන් අතර මැනි මැනියන් වහන්සේගේ (මව් දේවතා බිසවගේ) නාමයද ඇත. කර්තෘගේ අවසාන නිගමනය නම් මෙකී පුරාණ මනුෂ්‍ය වර්ගයා වරින් වර ඉන්දියාවේ වයඹ පිහිටි කාම්බෝජ දේශයෙන්, (දැනට පකිස්ථානයේ ගිනිකොණ දෙසින්) ලංකාද්-වීපයට සම්ප්‍රාප්ත වූ බවයි. පරණවිතාන මහතා ද මෙවැනි මතයක් ප්‍රකාශ කළේය. මීට සාධක වශයෙන් බ්‍රාහ්මීය සෙල්ලිපියක ඇති රෝහණ දේශයෙහි ඇති කාම්බෝජ නැමැති ගම සඳහන් කරයි. මෙහි යම්කිසි සත්‍යයක් තිබේ නම් මේ දේශ සීමාවෙන්

පැමිණි ජනයා ඉන්දු ශිෂ්ටාචාරයට උරුමක්කාරයන් වෙන්ට බැරි නැත. පැරණි අනුරාධපුරයෙහි තිබුණු නාන තටාක නාගරික ජලනල ක්‍රමය හා ස්වස්තිකයට සමාන සටහන් මෙවැනි ආශ්‍රයක ප්‍රතිඵල දැයි සැක සහිතය. ගල්ලෙන්වල, කැබිලිති කැලිවල, කාසිවල ඇති ඇතැම් සංඥා හා මුද්‍රා පැරණි සංස්කෘතියකට අයත් නෂ්ටාවශේෂ හැටියට සමහරු සැකකරති. පැරණි අනුරාධපුර නගරයෙහි පොළොව යට යොද තිබූ කසල කානු ක්‍රමය තවත් වැදගත් අංගයකි.

ලක්දිව ආදි වාසීන්ගෙන් ශේෂව ඇත්තේ වැදි ජනයා පමණයි. වැද්දන්ගේ මානව වංශය විමර්ශනය කිරීමෙන් හෙළිවෙන වැදගත් කරුණක් ඇත. ඔවුන්ගේ බාහිර ලක්ෂණ පරීක්ෂා කොට සිතන කල තුන් වර්ගයක් මිශ්‍රවීම හේතුකොට වැදි ජනයා වැදි තත්ත්වයට එන්ට ඇත. මෙකී වර්ගයා ඈත අතීතයේ සිට ඉන්දියාව හරහා ලක්දිවට පැමිණි බව සිතා ගැනීමට සාක්ෂි තිබේ. ඔවුන් රාක්ෂ, යක්ෂ, හා නාග ගෝත්‍රිකයන් සේ ගණන් ගත යුතුයි. ඔවුන් අතර මධ්‍යධරණී ප්‍රදේශයේ සිට ඉන්දියාව හරහා ලක්දිවට පැමිණි ජන කොටසක් සිටියේද?

යථොක්ත මූලික කරුණු සමාලෝචනය කරන විට පුරාණ ලංකාවේ බුදුසමය වැළඳ ගැනීමට පෙර ජනිතවූ සංවර්ධනය ශීඝ්‍රයෙන් නොව ක්‍රම ක්‍රමයෙන් වූවක් බව සිතිය හැක. පුරාණ දියුණුව පැරණි මනුෂ්‍ය වර්ගයක සංස්කෘතියක් පසුව පැමිණි වෙනත් වර්ගයක සංස්කෘතිය හා සංයෝග වීමෙන් බිහිවූවක් බව පිළිගැනීම වඩාත් නුවණට හුරුය. පෙර අතීතයේ ලක්දිව ඇතිවූ සිද්ධිය පුදුමයක් නොව සමාජ සම්මිශ්‍රණයකදී දක්නට ලැබෙන ස්වාභාවික ප්‍රතිඵලයයි. එසේ නැතිනම් ප්‍රගතියයි. එවකට ඉන්දියාදේශයේ නොතිබුණු යම් යම් ශාස්ත්‍ර ක්‍රම ලක්දිව වාසීන් දැන සිටින්නට ඇත. ඉන් එක් අංගයකි වාරිමාර්ග ක්‍රමය. වෙනත් දේ තිබෙන්නට ඇත. නමුත් දැනට ඒ කිසිවක් ගැන තවම දැනුමක් නැත. මේ ගැන පර්යේෂණ පවත්වා වෙනත් කරුණු සෙවීම උගතුන්ගේ පරම යුතුකමයි.

එබැවින් ලංකාවේ පැරණි කාලීන ඉතිහාසය (ප්‍රාග් ඉතිහාසය නොවේ) අළුත් ආකල්පයකින් සකස් විය යුතුයි. ඉන්දියාවේ නම් ''භාරතීය ඉතිහාස පරිෂද්'' මගින් නව ඉතිහාස කථාවක් ලියවී තිබේ. චීනයේ නව මුහුණුවරකින් අළුත් ඉතිහාස කථාවක් සකස් කරගෙන යනු ලැබේ. ලංකාව ගැන ද මෙවැනි ශාස්ත්‍රීය ව්‍යාපාරයක් ආරම්භ කිරීමට දැන් කාලයයි.

මේ සම්බන්ධයෙන් එක් යෝජනාවක් කරන්නට අවසර ලැබෙතොත් එය මෙසේය. සෝරත හිමිපාණන්ගේ ගුණ සිහිකිරීමට වාර්ෂික රැස්වීමක් පමණක් පැවැත්වීම ප්‍රමාණවත් නොවේ. සිංහල භාෂාවේ ශබ්දකෝෂයක් නිෂ්පාදනය කළේ අති පැරණි ශ්‍රේෂ්ඨ සිංහල ජනයාගේ පැරණි භාෂාවක ඉතිහාසය විදහාපාමින් අර්ථ නිරූපණය කිරීමටයි. එවැනි ජාතියකට අයත් ජනයාගේ මුල් ඉතිහාසය තවදුරටත් සෙවීම ඉතා වැදගත් කාර්යයකි. ඒ සඳහා විද්‍යෝදය විශ්ව විද්‍යාලයේම පුරාවිද්‍යාව හා මානව විද්‍යාව පිළිබඳ නව විද්‍යා පීඨයක් සෝරත නාහිමිපාණන්ගේ නමින් ස්ථිර සිහිවටනක් වශයෙන් ආරම්භ කිරීම කාලෝචිත නොවන්නේ මක්නිසා ද?.

* 1978 ශ්‍රී සෝරත අනුස්මරණ දේශනය.